ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,881 - 2014 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා - 2014.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු-ඇබෑර්තු	1112	පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ...	—
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—	ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
පළාත් පාලන නිවේදන	1114	අයවැය ලේඛන	—
අතුරු ව්‍යවස්ථා	—	දේපළ විකිණීම්	—
		විවිධ දැන්වීම්	1117

සැ. යු. - ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ඔක්තෝබර් මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1111 - B 80872— 2,875 (2014/09)
F 1 –

තනතුරු - ඇබෑර්තු

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල

අංක 1877-2014 අගෝස්තු මස 22 වැනි සිකුරාදා *ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් දැන්වීම මතු දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

සංශෝධනය කරනු ලබන වගන්ති :

	තනතුරු නාමය	*පුරප්පාඩු සංඛ්‍යාව*	
01.	රියදුරු II ආ පන්තිය	නැත	(රියදුරු II ආ පන්තියේ පැවති පුරප්පාඩුව 2014.09.01 දින ස්ථාන මාරු කිරීමක් මගින් සම්පූර්ණ කර ඇත.)
02.	බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු	01	(තනතුරු 03 ක් ලෙස සඳහන් වුවත් එය තනතුරු 01 ක් වශයෙන් සංශෝධනය විය යුතු ය.)

එම්. එච්. ටී. ශශිකා දේවප්‍රිය,
ලේකම්,
සීතාවකපුර නගර සභාව,
අවිස්සාවේල්ල.

09-633

දඹුල්ල මහා නගර සභාව

දඹුල්ල මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත සඳහන් කරුණුවලට අදාළ අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, දඹුල්ල මහා නගර සභාව" යන ලිපිනයට 2014.10.20 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අනු. අංකය	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*වැටුප් ක්‍රමය*	*අධ්‍යාපන සුදුසුකම්*
01	මාර්ග කම්කරු	29	රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (06/2006 (iv) අනුව PLI - 2006A)	දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය.
02	සෞඛ්‍ය කම්කරු	28	රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (06/2006 (iv) අනුව PLI - 2006A)	අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත් වී තිබීම.
03	රියදුරු	3	රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 - (06/2006) (iv) අනුව PL03 - 2006A)	අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත්වී තිබිය යුතුය. අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 5 ක් සමත් විය යුතු ය.
04	කාර්යාල කාර්යය සහායක	1	රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (06/2006 (iv) අනුව PLI- 2006A)	දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය.

අනු අංකය	තනතුරු නාමය	තනතුරු සංඛ්‍යාව	වැටුප් ක්‍රමය	අධ්‍යාපන සුදුසුකම්
05	ආදාහනාගාර යන්ත්‍ර ක්‍රියාකරු සහායක	1	රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x145 - 12 x 160 - රු. 17,600 - (06/2006 (iv) අනුව PLI - 2006A)	දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය.

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම්* :

(i) අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
(ii) තෝරාගනු ලබන්නේ අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ව ය. එම කාලය තුළ දී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.

06. *වෙනත් පොදු කොන්දේසි* :

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.
(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු අතර, රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.
(v) දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාථ කිරීමට වසමේ ග්‍රාම නිළධාරීගේ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතු ය.

07. *අයදුම්කළ යුතු ආකාරය* :— මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පමණක් අයදුම්පත් 2014.10.20 වැනි දිනට හෝ එදිනට පෙර "නාගරික කොමසාරිස්" දඹුල්ල මහා නගර සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

(දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.)

08. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක්;
(iv) මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක් (එකක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතු ය);
(v) වෘත්තීය පිළිබඳ සහතික තිබේ නම් එම සහතික;
(vi) සේවා සහතිකය (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි.);

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු ය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු 1ය.

අමිල නවරත්න,
නාගරික කොමසාරිස්,
දඹුල්ල මහා නගර සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දඹුල්ල මහ නගර සභාවේ..........................තනතුරට බඳවා ගැනීම

1. (අ) මුල්'කුරු සමග නම :——————————.
   ආ) මුල්'කුරුවලින් හැඳින්වෙන නම්:——————————.
2. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
   (ආ) ස්ථිර පදිංචි ලිපිනය:——————————.
3. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
4. (අ) උපන් දිනය:——————
   (ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ
   අවුරුදු :————— මාස :————— දින :—————
5. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
6. විවාහක/අවිවාහක බව:——————————.
7. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද?:——————————.
8. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද? එසේ නම් ඒ විස්තර:—————
9. අධ්‍යාපන සුදුසුකම් :
   (අ) විභාගයේ නම :——————————.
   (ආ) විභාග අංකය :——————————.
   (ඇ) සමත් වර්ෂය :——————————.
   (ඈ) සමත් විෂයයන් :——————————.
10. වෘත්තීමය සුදුසුකම් හා පළපුරුද්ද :——————————.
11. ඔබ දැනටමත් මෙහි ආදේශකව සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/දීමනා/ආදේශක ද යන වග) :——————————.
12. වෙනත් සුදුසුකම් :——————————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් වන තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

09-642

පළාත් පාලන නිවේදන

මහරගම නගර සභාව

නගර සභා ආඥා පනත යටතේ (255 වන අධිකාරිය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥා පනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාල දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුලත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2014 අගෝස්තු මස 29 වැනි දින.

උපලේඛනය

පාරේ නම	:	මහරගම, නාවින්න, පරණ කොට්ටාව පාර, අංක 89/1සිට 89/2 දරන නිවාස පිහිටි අතුරු මාර්ගය
දිග	:	අඩි 430
පළල	:	අඩි 10
ආරම්භය	:	ව. අ. 89
අවසානය	:	ව. අ. 89/14

වම් පස පදිංචිකරුවන්		දකුණු පස පදිංචිකරුවන්	
01.	ශීලා වඩුගේ මිය	01.	ඩී. ඒ. කොතලාවල මයා
02.	ඊ. ඩී. ලලිතා ද අල්විස් මිය	02.	බී. ඒ. ධර්මදාස මයා
03.	ධර්මා කරුණාරත්න මයා	03.	හේමන්ත බටගොඩ මයා
04.	ඊ. ඩී. චමින්ද අල්විස් මයා	04.	වසන්තා බටගොඩ මයා
		05.	බන්දු සිල්වා මයා
		06.	ඒ. ඊ. ඒ හේමපාලද අල්විස් මයා

පාරේ නම	:	රුක්මලේ බාලිකා නිවාස පාරට මුහුණලා පිහිටි වරිපනම් අංක 192/3 සිට 192/1, යන නිවාස පිහිටි මාර්ගය
දිග	:	අඩි 540
පළල	:	අඩි 11 ත් 13 ත් අතර
ආරම්භය	:	ව. අ. 194
අවසානය	:	ව. අ. 192/7

පාරේ නම	:	මහරගම, පන්සල පාරේ, "ගමඉමවත්ත" නමැති නිවාස සංකීර්ණයට ප්‍රවේශ වන මාර්ගය (අංක 159 සිට 159/1 දරන නිවාස පිහිටි) මාර්ගය
දිග	:	අඩි 412
පළල	:	අඩි 20
ආරම්භය	:	ව. අ. 159
අවසානය	:	ව. අ. 159/G

09-520

කුරුණෑගල මහ නගර සභා

කුරුණෑගල මහ නගර සභාවේ 1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 90 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 90 වැනි වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳව ආඥා පනතෙහි 1 වන පරිච්ඡේදය 4 වන වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල මහ නගර සභාව විසින් මෙම පහත උපලේඛනයේ දක්වා ඇති මල්කඩුවාව පොදු සුසාන භූමිය කුරුණෑගල මහ නගර සභාව සතු පොදු සුසාන භූමියක් ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට කුරුණෑගල මහ නගර සභාව විසින් මැන සලකුණු කර ඇති මෙම සුසාන භූමියේ මායිම් සම්බන්ධයෙන් කිසියම් පාර්ශවයක් විසින් යම් විරුද්ධත්වයක් පල කරනු ලබන්නේ නම් මෙම නිවේදනයකර ලිත් මාසයක් ඇතුලත මා වෙත ඉදිරිපත් කරන ලෙස 1947 අංක 16 දරන මහ නගර සභා පනතේ 90 වැනි වගන්ති ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, තිරගම් 10 කෝරළයේ, කුරුණෑගල මහා නාගරිකයේ මඩමේගම පිහිටි කොටුවේ හේන නම් ඉඩම 2011.06.27 දින නැවත මැනීම කර බලයලත් මිනින්දෝරු කෝලිත ඩී. දසනායක විසින් මැන සාදන ලද අංක 1348 ඒ දරන පිඹුරේ පිළිවෙලින් පහත පරිදි ප්‍රමාණයන් හා මායිම් දැක්වෙන කැබලි අංක 01 සහ 02 යන කැබලි දෙකේ ඒකාබද්ධ ප්‍රමාණය අක්කර 10 රූඩ් 01 පර්චස් 26.1 හෙවත් හෙක්ටයාර් 4.21405 ත් මල්කඩුවාව පොදු සුසාන භූමිය ලෙස භාවිතා කෙරේ. එකී කැබලි 02 පහත සඳහන් පරිදි වෙන් වෙන්ව විස්තර කෙරේ.

කැබලි අංක 01 (ප්‍රමාණය අක්කර 07 රූඩ් 02 පර්චස් 09)

උතුර	:	මීගමු පාර සහ මීගමු පාරෙන් කොළඹ පාරට සහ මහා නගර සභා මාර්ගය ;
නැගෙනහිර	:	මීගමු පාරෙන් කොළඹ පාරට යන මහා නගර සභා මාර්ගය ;
දකුණ	:	රාජිත ජයතිලක සහ තව අයට අයිති ඉඩම සහ කුරුණෑගල කාලගුණ දෙපාර්තමේන්තු කාර්යාලය
බටහිර	:	රාජිත ජයතිලක සහ තව අයට අයිති ඉඩම සහ මීගමු පාර

කැබලි අංක 02 (ප්‍රමාණය අක්කර 02 රූඩ් 03 පර්චස් 17.1)

උතුර	:	මීගමු පාර සහ පෝරතේ වත්ත පාර ;
නැගෙනහිර	:	පී. පී. 7764/3A සහ පී.පී. 7764/3B යන ඉඩම් කොටස් ;
දකුණ	:	මීගමු පාරෙන් කොළඹ පාරට යන නගර සභා පාර සහ පීපී 7764/3B යන ඉඩම ;
බටහිර	:	මීගමු පාරෙන් කොළඹ පාරට යන මාර්ගය ;

ජී. කේ. එස්. චන්ද්‍රලතා,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
කුරුණෑගල.

2014 අගෝස්තු මස 29 වැනිදා.

09-551

වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව – පුත්තූර්

1975 අංක 17 දරන පනතේ කම්ටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනයයි

පහත ශීර්ෂයේ සඳහන් කර ඇති පුද්ගලයාගේ ඉඩම් ඔහුගේ නමට ඉදිරියෙන් පවරා ඇති කම්ටුව 2015 වර්ෂයේ පවත්වාගෙන යෑමට ඉහත අයිතිය ලබා දෙන පනතේ 06 වැනි වගන්තිය අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

ඉහත අයිතිය ලබා දීමට යෝජනා කර ඇති කම්ටුව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අදාල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළ කරයි නම් *ගැසට් නිවේදනය* පළකර ඇති දින සිට සති හතරක් ඉක්ම යෑමට පෙර ලිඛිත පිටපතක් මා වෙත එවිය යුතු බව දන්වමි.

කේ. තුරෙයිසිංහම්,
සභාපති.

2014 ජූලි මස 30 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
වලිකාමම් නැගෙනහිර,
පුත්තූර්.

අයදුම්කරුගේ නම සහ ලිපිනය	*කම්ටුවේ සභාපති/ලේකම් ද කලමණාකරු ද යන වග*	*කම්ටුවේ නම*	*කම්ටුව පවත්වාගෙන යාමට සුදුසු යැයි යෝජනා කර ඇති ස්ථානය*
සිවප්‍රකාශම් සිවරූබන් කුවිල් පුලෝලි දකුණ පුලෝලි	ලේකම්	රෝයල් ක්‍රීඩා සමාජය	චුන්නාගම් පුර පුත්තූර්

09-632

කෑගල්ල නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2015 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමෙ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති හතරක් (04) ඇතුලත් තම විරුද්ධතාවයට හේතුව ලියවිල්ලකින් දන්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

පී. කේ. සමරසිංහ,
සභාපති,
නගර සභාව - කෑගල්ල.

2014 අගෝස්තු මස 27 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය	*සමාජ ශාලාවේ සභාපති/ලේකම්ද යන වග*	*සමාජශාලාවේ නම*	*සමාජශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය පවත්වන ස්ථානය*
විදාන හේනයලාගේ සිරිල් 167/28, ඔලගම, කෑගල්ල	සභාපති	බිලූ ලයිට් ට්‍රේඩර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට්	අංක 152, කළුගල්ල මාවත, කෑගල්ල.

09-641

විවිධ දැන්වීම්

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීම - 2015 වර්ෂය

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මහ නගර සභා ආඥා පනතේ 247ඉ වගන්තිය ප්‍රකාරව දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු විසින්, බ්‍රෝකර්කරුවෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු නැතහොත් අන් නියෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් එකක් විකිණීමෙන් ලැබෙන මුදලින් 1%කට (සියයට එකක්) සමග බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ අයදුම්කරු හෝ ඔහුගේ අනු නියෝජිතයෙකු විසින් ගෙවිය යුතු යැයි යෝජනා කරන්නීය.

09-513/9

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

විනෝද බදු අයකිරීම - 2015 වර්ෂය

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

277 අධිකාරය මත විනෝද බදු ආඥාපනතේ 6 වැනි වගන්තිය පරිදි වූ විනෝද කටයුත්තක් (ඊට වේදිකා නාට්‍ය, මුද්‍රා නාට්‍ය, රූකඩ සහ වේදිකා මත කෙරෙන සමාන සහ වෙනත් අංගයක් ඇතුළත් නොවේ). නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර ගාස්තු මත 25%ක බද්දක් අයකිරීම යෝජනා කරන්නීය.

09-513/8

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති හෝටල් ආපනශාලා නවාතැන් පොලවල් සියයට 01% බදු අයකිරීම - 2015 වර්ෂය

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

එසේම 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ හෝටලයක, ආපන ශාලාවක, නවාතැන් පොලක පෙර වර්ෂයන් ලැබීම් මත සියයට 01% ගාස්තු අයකරනු ලැබේ.

09-513/7

දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව

2015 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

පොළ ගාස්තු (වැට් බද්ද ඇතුළුව)

	විස්තරය	*ගාස්තුව රු. ශත*
1.	සාප්පු බඩු වෙළඳාම සඳහා	50 0
2.	මාළු පමණක් වෙළඳාම සඳහා	50 0
3.	එළවළු ලෑල්ලක් සඳහා	30 0
4.	පළතුරු පමණක් විකිණීම සඳහා	20 0
5.	පළා වර්ග පමණක් විකිණීම සඳහා	15 0
6.	එළවළු/පළතුරු/පළා වර්ග මිශ්‍ර සිල්ලර බඩු	50 0
7.	වෙනත් සුළු වෙළෙඳාම සඳහා	10 0
8.	වාහනයක් මගින් වෙළඳාම් කරයි නම්, වෑන් රථයක් සඳහා	100 0
9.	ලොරි රථයක් සඳහා	200 0

උපලේඛන අංක 02 - විවිධ බලපත්‍ර සඳහා ගාස්තු

	විස්තරය	ගාස්තුව රු. ශත
1.	වෙන්දේසි/බ්‍රෝකර් බලපත්‍රයක් සඳහා	500 0
2.	සංචාරක වෙළඳ බලපත්‍රයක් සඳහා	300 0
3.	දේපළ උකස්කරයක් ලියාපදිංචි කිරීම සඳහා	500 0
4.	සංදර්ශන බලපත්‍රයක් සඳහා	300 0
5.	ගෝඝාතක බලපත්‍රයක් සඳහා - ගවයෙකුට	300 0
	එළුවෙකුට	200 0
6.	ප්‍රසිද්ධ රැගුම් බලපත්‍රයක් සඳහා	200 0

මෙම ගාස්තුවලට අමතරව එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද අය කරනු ලැබේ.

උපලේඛන අංක 03 - වාහන ගාල් කිරීමේ ගාස්තු (වැට් බද්ද ඇතුළුව)
(පැය 2ක කාලයක් ගාල් කිරීම සඳහා)

	විස්තරය	ගාස්තුව රු. ශත
1.	යතුරු පැදියක් සඳහා	10 0
2.	මෝටර් කාර් එකක්/ත්‍රිරෝද රථයක් සඳහා	15 0
3.	වෑන් රථයක්/මිනි බස් රථයක් සඳහා	20 0
4.	ලොරියක් හා තනි දොර බස් රථයක් සඳහා	50 0
5.	පාපැදියකට	5 0
6.	සංචාරක බස් රථයක් සඳහා -	
	දොර දෙක	100 0
	තනි දොර	50 0

09-513/2

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

වරිපනම් බදු පනවා අය කිරීම – 2015

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් දෙහිවල -ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2015 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර දෙහිවල -ගල්කිස්ස මහ නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහ (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

වරිපනම් බදු පනවා අය කිරීම

මහ නගර සභා ආඥාපනතේ 230 වගන්තිය හා එහි අනු වගන්ති අනුව 2015 වර්ෂය සඳහා පනවා අය කළ යුතු වරිපනම් බදු ප්‍රතිශතය තීරණය කිරීම සලකා බැලීම පිණිස පහත සඳහන් වාර්තාව මුදල් කාරක සභාවට ඉදිරිපත් කිරීම මැනවි.

01. 2015 වර්ෂය සඳහා පනවා අය කරනු ලබන බදු ප්‍රතිශතය

දේපළ ස්වභාවය	ප්‍රතිශතය
I. වෙළඳ හෝ වාණිජ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ස්ථාන වල වාර්ෂික වටිනාකමින්	30%
II. වෙළඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ස්ථානවල වාර්ෂික වටිනාකමින්	6%
III. මුඩු ඉඩම් හා හිස් ඉඩම් සඳහා වාර්ෂික වටිනාකමින්	6%

2013 වර්ෂයේ දී කරන ලද සමීක්ෂණය අනුව මුළු දේපළ සංඛ්‍යාව 78734 ක් පමණ වන අතර ඉන් වාණිජ දේපළ 10052 ක් ද වෙළඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන 63508 විය. එමගින් රුපියල් දස ලක්ෂ 330.00ක ආදායමක් අපේක්ෂා කර ඇත. (වාණිජ දේපල වලින් රුපියල් දස ලක්ෂ 200.00 ක් ද, නේවාසික දේපලවලින් රුපියල් දස ලක්ෂ 130.00 ක් ද වේ.)

02. අවසාන වරට තක්සේරු ප්‍රතිශෝධනය ක්‍රියාත්මක වූයේ 2013.01.01. දින සිට වන අතර එම වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 5ක් සඳහා දක්වා ඇති ප්‍රතිශෝධනයට අනුව වරිපනම් බදු අය කරනු ලබයි.

03.I. ඉහත 01 හා 02 කරුණු සලකා 2015 වර්ෂය සඳහා නේවාසික දේපල මත 6%ක වාර්ෂික බදු ප්‍රතිශතයක් ද මුඩු ඉඩම් හා හිස් ඉඩම් සඳහා 6%ක වාර්ෂික බදු ප්‍රතිශතයක් ද වෙළඳ හෝ වාණිජ කාර්යයන් සඳහා භාවිත කරනු ලබන දේපල සඳහා 30%ක වාර්ෂික බදු ප්‍රතිශතයක් ද දේපල වාර්ෂික වටිනාකම මත අය කිරීමට යෝජනා කරයි.

II. ඉහත 1 හි යෝජිත පරිදි ප්‍රතිශතයන්ට අනුව වරිපනම් බදු පැනවීමෙන් 2015 වර්ෂයේදී වාණිජ කාර්යයන් සඳහා භාවිත කරනු ලබන දේපලවලින් රුපියල් දසලක්ෂ 200.00ක පමණ ආදායමක්ද වෙළඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථානවල වාර්ෂික වටිනාකම මත භාවිතා කරනු ලබන දේපලවලින් රුපියල් මිලියන 130.00 ක පමණ ආදායමක් ද අපේක්ෂා කෙරේ.

III. වාර්ෂික වරිපනම් බදු මුදල් පහත පරිදි සමාන වාරික 4කින් අය කිරීමටත්, ගෙවීම් අවසන් වන දිනය සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් වන්නේ නම් ඊට පෙර ඇති කාර්යාලීය වැඩ කරන දිනය ඒ ඒ කාර්තු සඳහා වාරික ගෙවිය යුතු අවසන් දිනය ලෙස සැලකීමට යෝජනා කෙරේ.

IV. තවද අදාල කාර්තු තුළ ගෙවීම් නොකරන වරිපනම් බදු සඳහා ඊළඟ කාර්තුවේ සිට වෙළඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන සඳහා භාවිත කරන දේපල හා මුඩු ඉඩම් හා හිස් ඉඩම් වල කාර්තු ගාස්තුවෙන් 15%ක වරෙන්තු ගාස්තුවක් අය කිරීමටත් වාණිජමය කාර්යයන් සඳහා භාවිතා කරන දේපලවලින් වරෙන්තු ගාස්තුව ලෙස කාර්තු ගාස්තුවෙන් 20% ක් අය කිරීමටත් යෝජනා කරයි.

පළමු වාරිකය	-	2015 මාර්තු 31 ට හෝ ඊට පෙර
දෙවන වාරිකය	-	2015 ජුනි 30ට හෝ ඊට පෙර
තුන්වන වාරිකය	-	2015 සැප්තැම්බර් 30ට හෝ ඊට පෙර
හතරවන වාරිකය	-	2015 දෙසැම්බර් 31 ට හෝ ඊට පෙර

09-513/10

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

2015 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥා පනතේ 247 ඈ වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, එවැනි යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක,

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2015 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙක (0.2%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2015 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවට ගෙවිය යුතු යයි විධාන කිරීමටත් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නී ය.

09-513/5

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2015 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද බව 1991 නොවැම්බර් මස 29 දිනැති ගැසට් පත්‍රයේ නිවේදනයට කරනු ලැබූ, අංක 541/17 දරන 1989.01.20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති මහ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ I වැනි කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් 2015 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම ඒ උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එකී II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 247අ වැනි වගන්තියෙන් මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නී ය.

එසේම 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ හෝටලයක ආපන ශාලාවක හෝ නවාතැන් පොළක පෙර වර්ෂයේ ලැබීම් මත සියයට 0.5% ගාස්තු අය කරනු ලැබේ.

බලපත්‍ර ගාස්තු අය කර ගැනීමේදී මේ වන විට ඉදිරිපත් කර ඇති යෝජනාවලට අමතර පහත කරුණු අමතර වශයෙන් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරමි.

1. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි කිහිපයක් එක් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා බලපත්‍ර ගාස්තු අය කරනු ඇත.

2. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාර හෝ කර්මාන්තය සඳහා යොදා ගෙන ඇති බිම් ප්‍රමාණයේ අනුපාතය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර බලපත්‍ර ගාස්තු වෙන වෙනම අය කරනු ඇත.

3. වරිපනම් අංක කීපයකින් සමන්විත ගොඩනැගිල්ලක එකම වර්ගයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන විටදී එය එක් වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකා බලපත්‍ර ගාස්තු අය කරනු ඇත. ගාස්තුව ගණනය කිරීමේදී අදාළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරුව අනුව බලපත්‍ර ගාස්තු තීරණය කරනු ඇත.

4. වරිපනම් අංක කිහිපයක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංකය එකට යාව පිහිටියේ වුවද තම එක් එක් ව්‍යාපාර හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම බලපත්‍ර ගාස්තු අය කරනු ඇත.

5. එක් වරිපනම් අංකයක් යටතේ ව්‍යාපාර කීපයක් පවත්වාගෙන යන්නේ නම් ඒ එක් එක් ව්‍යාපාරය සඳහා යොදා ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණයට අනුපාතව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර බලපත්‍ර ගාස්තු වෙන වෙනම අය කරනු ඇත.

උපලේඛනය

I වැනි කොටස

1. ඌරන් ආදී සතුන් ඇති කිරීම
2. මාළු විකිණීම
3. මස් විකිණීම
4. ඝාතකාගාරය
5. කොණ්ඩා සකසන්නන්ගේ සහ බාබර්වරුන්ගේ සාප්පු සහ සැලුන් හල්
6. හම්, බෙට්, ඇට, කුඩු හෝ පෝර හෝ විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් මතුවන ද්‍රව්‍ය විකිණීම හෝ ගබඩා කිරීම
7. ලොන්ඩරි
8. ලැගුම් නිවාස
9. හෝටල්
10. බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩ
11. කිරි පට්ටි හා කිරි විකිණීම
12. බේකරි
13. අවමංගල්‍ය ශාලා සහ අවමංගල්‍ය කටයුතු භාරකරුවෝ
14. සිසිල් බීම නිෂ්පාදනය
15. අයිස් කර්මාන්ත ශාලා
16. මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම
17. මිනිරන් ගබඩාකර තැබීම
18. පොහොර නිෂ්පාදනය
19. පොහොර ගබඩාකර තැබීම
20. හම් ගබඩාකර තැබීම
21. උම්බලකඩ හොණ්ඩර පහකට වැඩියෙන් ගබඩා කිරීම
22. කුකුළු වෙළෙඳ පොළක් පවත්වාගෙන යාම
23. කලුගල් කැඩීම සහ කබොක් කැපීම
24. බොරලු හෑරීම
25. අශ්වයන් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළෙඳ පොළක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම
26. පශු ගිලන් හලක් පවත්වාගෙන යාම
27. රබර් සකස් කිරීම
28. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අලුත් වැඩියා කිරීම හෝ ඒවායේ දූවිලි ඉවත් කිරීම
29. පුවක් සකස් කිරීම
30. තලාතු මිනිරන් සකස් කිරීම
31. බැටළුවන් හෝ එළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම
32. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
33. හුණු ගබඩාකොට තැබීම
34. බොම්බයි එළුණු හොණ්ඩර 5 කට වඩා ගබඩාකොට තබා ගැනීම
35. අර්තාපල් හොණ්ඩර 5 කට වඩා ගබඩාකොට තබා ගැනීම
36. පොල් කටු අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩාකොට තබා ගැනීම
37. කුරුඳු, කරඳමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම
38. පරණ ලෝහ ගබඩාකර තැබීම
39. සිමෙන්ති හොණ්ඩර 25 කට වඩා ගබඩාකර තැබීම
40. කරවල හොණ්ඩර 10 කට වඩා ගබඩා කර තැබීම
41. ලුණු දැමූ මාළු හොණ්ඩර 10 කට වඩා ගබඩාකර තැබීම
42. රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම
43. ට්‍රංක් පෙට්ටි නිෂ්පාදනය
44. මරා සකස් කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම
45. ගම් වර්ග නිෂ්පාදනය
46. විෂ බීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
47. බැටරි පුරවනු ලබන්නා වූ හෝ බැටරි ගබඩා කොට තබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
48. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
49. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
50. හිස් බෝතල් 100 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
51. කුරුඳු පොතු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
52. කොකෝවා හොණ්ඩර 10 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
53. මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ මිනී පෙට්ටි සහ ගබඩා කොට තැබීම.
54. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ ගෘහ භාණ් සෑදීම සහ ගබඩා කොට තැබීම.
55. මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔප දැමීම
56. බලපත්‍ර ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩාකොට තැබීම
57. වේවැල් බඩු සෑදීම හෝ ගබඩාකොට තැබීම හෝ වේවැල් බඩු සෑදීම සහ ගබඩා කොට තැබීම.
58. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකොට තැබීම
59. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
60. පිටි හෝ කුළු බඩු ඇඹරීම
61. පුන්නක්කු හැර සත්ව ආහාර හොණ්ඩර 20කට වඩා ගබඩාකොට තැබීම
62. සත්ව ආහාර හැර , වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම (සමුපකාර සමිති හැර)
63. රබර් භාණ්ඩ නිෂ්පාදනය
64. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම
65. යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම
66. පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
67. පොලිතින්, සෙලියුලොයිඩ් හෝ කර්ස්පෙක්ස් නිෂ්පාදනය සහ ගබඩා කර තැබීම
68. ඇසිඩ් ගැළුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
69. කපුරු නිෂ්පාදනය
70. බූට් සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය
71. ඉටිපන්දම් නිෂ්පාදනය
72. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම
73. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
74. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය
75. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය
76. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම
77. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩාකොට තැබීම හෝ කෙඳි නිෂ්පාදනය සහ ගබඩා කොට තැබීම.
78. ගිනිපෙට්ටි නිෂ්පාදනය
79. ඉඹුල් පුළුන් ගබඩාකොට තැබීම
80. පොල් තෙල් ගැළුම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
81. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩාකොට තැබීම
82. ඇසිටලීන් නිෂ්පාදනය
83. උළු 500 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
84. ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
85. කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
86. සිගරට් නිෂ්පාදනය
87. බීඩි නිෂ්පාදනය
88. තීන්ත හෝ වාර්නිෂ් හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
89. ලී පෙට්ටි හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
90. කොහු නිෂ්පාදනය
91. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි හැර වෙනත් ගෝනි 100 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
92. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම

93. රස කැවිලි නිෂ්පාදනය
94. පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම
95. බෝට්ටු හෝ බත්තල් සෑදීම
96. ලී පෙට්ටි සෑදීම
97. ඔක්සිජන් සහ වැල්ඩින් වැඩ කරනු ලබන්නා වූ මෝටර් වාහන අළුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
98. මෝටර් වාහන අළුත්වැඩියා කරන්නා වූ ද, යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
99. මෝටර් වාහන අළුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම
100. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
101. යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නා වූ ද මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
102. අතින් හෝ පොලුවලින් ක්‍රියාකරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
103. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කොට තැබීම
104. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
105. ගෙන්දගම් සහ ගෙන්දගම් කුඩු කිලෝ ග්‍රෑම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
106. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය
107. 100 කට අධික ප්‍රමාණයක් පතුරොම් ගබඩා කොට තැබීම.
108. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ ගබඩා කොට තැබීම.
109. අළුත් ටයර් හෝ ටියුබ් 150 කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
110. පාවිච්චි කළ කඩදාසි කිලෝ ග්‍රෑම් 250 කට අධික ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
111. ස්ප්‍රේ පේන්ටින්ග් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
112. යාන්ත්‍රික ශීතකරණ සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
113. යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නා වූ ද ඇඳුම් මැසීම කරනු ලබන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
114. කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම.
115. ඩ්‍රයි ක්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම.
116. යාන්ත්‍රික බලය පාවිච්චි නොකෙරෙන, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
117. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද, වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
118. ගල් අඟුරු, ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම.
119. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය
120. අශුද්ධ ලෝහ උණු කිරීම.
121. ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම.
122. කිලෝ ග්‍රෑම් දෙකකට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරණ ද්‍රව්‍ය ගබඩා කොට තැබීම.
123. ගම්, ඉටි, හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම.
124. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය
125 තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
126. ශීතකරණ අළුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
127. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
128. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
129. පුපුරන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

2 වැනි කොටස

I තීරුව වාර්ෂික වටිනාකම	*II තීරුව ගෙවිය යුතු බද්ද (රු. ශත)*
1. රු. 2,500 නොඉක්මවන අවස්ථාවක	250 0
2. රු. 2,500 ඉක්මවන නමුත් රු. 4,000 නොඉක්මවන විට	500 0
3. රු. 4,000 ඉක්මවන නමුත් රු. 10,000 නොඉක්මවන විට	750 0
4. රු. 10,000 ඉක්මවන නමුත් රු. 25,000 නොඉක්මවන විට	1,250 0
5. රු. 25,000 ඉක්මවන නමුත් රු. 35,000 නොඉක්මවන විට	2,000 0
6. රු. 35,000 ඉක්මවන නමුත් රු. 50,000 නොඉක්මවන විට	2,750 0
7. රු. 50,000 ඉක්මවන නමුත් රු.75,000 නොඉක්මවන විට	3,500 0
8. රු. 75,000 ඉක්මවන නමුත් රු. 100,000 නොඉක්මවන විට	4,250 0
9. රු. 100,000 ඉක්මවන විට	5,000 0

09-513/11

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

2015 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 247ආ වැනි වගන්තියෙන් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන්නා වූ කිසියම් කර්මාන්තයක් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2015 වර්ෂයේදී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙකුම, එකී කර්මාන්ත බද්ද 2015 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නී ය.

ව්‍යාපාර බදු අය කර ගැනීමේදී මේ වන විට ඉදිරිපත් කර ඇති යෝජනාවලට අමතර පහත කරුණු අමතර වශයෙන් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරමි.

1. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි කිහිපයක් එක් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා බලපත්‍ර ගාස්තු අය කරනු ඇත.

2. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාර හෝ කර්මාන්තය සඳහා යොදා ගෙන ඇති බිම් ප්‍රමාණයේ අනුපාතය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

3. වරිපනම් අංක කීපයකින් සමන්විත ගොඩනැගිල්ලක එකම වර්ගයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන විට දී එය එකම වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකා ව්‍යාපාර බදු අය කරනු ඇත. ගාස්තුව ගණනය කිරීමේ දී අදාළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරුව අනුව ව්‍යාපාරික බද්ද තීරණය කරනු ඇත.

4. වරිපනම් අංක කිහිපයක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංකය එකට යාව පිහිටියේ වුව ද තම එක් එක් ව්‍යාපාර හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම බලපත්‍ර ගාස්තු අය කරනු ඇත.

5. එක් වරිපනම් අංකයක් යටතේ ව්‍යාපාර කීපයක් පවත්වාගෙන යන්නේ නම් ඒ එක් එක් ව්‍යාපාරය සඳහා යොදා ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණයට අනුපාතව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

උපලේඛනය

I තීරුව *වාර්ෂික වටිනාකම*	*II තීරුව* *ගෙවිය යුතු බද්ද* *(රු. ශත)*
1. රු. 2,500 නොඉක්මවන අවස්ථාවක	250 0
2. රු. 2,500 ඉක්මවන නමුත් රු. 4,000 නොඉක්මවන විට	500 0
3. රු. 4,000 ඉක්මවන නමුත් රු. 10,000 නොඉක්මවන විට	750 0
4. රු. 10,000 ඉක්මවන නමුත් රු. 25,000 නොඉක්මවන විට	1,250 0
5. රු. 25,000 ඉක්මවන නමුත් රු. 35,000 නොඉක්මවන විට	2,000 0
6. රු. 35,000 ඉක්මවන නමුත් රු. 50,000 නොඉක්මවන විට	2,750 0
7. රු. 50,000 ඉක්මවන නමුත් රු.75,000 නොඉක්මවන විට	3,500 0
8. රු. 75,000 ඉක්මවන නමුත් රු. 100,000 නොඉක්මවන විට	4,250 0
9. රු. 100,000 ඉක්මවන විට	5,000 0

09-513/3

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2015 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගොස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 247 ඇ වැනි වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී අඥාපනතේ 247 ආ වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ ද කිසියම් ව්‍යාපාරයක් දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2015 වර්ෂයේ දී කර ගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක් ම, එකී ව්‍යාපාර බද්ද 2015 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දෙහිවල - ගල්කිස මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
2. රු. 6,000 ඉක්මවන නමුත් රු 12,000 නොඉක්මවන විට	90 0
3. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
4. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
5. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
6. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

09-513/4

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2015 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ)01 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගොස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

විස්තරය	ගාස්තුව (වර්ග අඩියකට) සාමාන්‍ය රු. ශත	ප්‍රතිදීපන රු. ශත
1. සාමාන්‍ය ව්‍යාපාර නාම පුවරුවක් සඳහා -		
(i) වර්ග අඩි 50 දක්වා	ගාස්තු නැත	50 0
(ii) ව්‍යාපාර නාම පුවරු සඳහා වර්ග අඩි 50 ඉක්මවන්නේ නම් (සම්පූර්ණ වර්ගඵලයට)	30 0	50 0
(iii) සාමාන්‍ය වෙළඳ ව්‍යාපාරයක් වෙළඳ නාම පුවරුවක වෙනත් ආයතනයක හෝ භාණ්ඩයක හෝ සේවාවක් සඳහා පුළුල් ප්‍රදර්ශනයක් කරන්නේ නම් ඒවා අංක 02 යටතේ ගාස්තුවලට යටත් වේ.		
2. ගොඩනැගිලි මත හෝ භූමියක සවිකර ඇති ගුවන් පුවරුවක් හෝ බිත්තියක් මත සවි කර ඇති ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා -		
(i) මධ්‍යම රජය මගින් නඩත්තු කරන මාර්ගවල සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය වන පුවරු සඳහා ගාස්තුව		
වර්ග අඩි ප්‍රමාණය 100 ඉක්මවන විට	150 0	200 0
වර්ග අඩි ප්‍රමාණය 100 නොඉක්මවවිට	100 0	150 0
(ii) පළාත් සභාව මගින් නඩත්තු කරන පාරට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන පුවරු සඳහා ගාස්තු වර්ග අඩි ප්‍රමාණය 100 ඉක්මවන විට	100 0	150 0
වර්ග අඩි ප්‍රමාණය 100 නොඉක්මවන විට	50 0	75 0
(iii) අනෙකුත් අතුරු මාර්ගවල සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන පුවරු ගාස්තු	50 0	75 0
3. බිත්තියක් මත තීන්ත ආලේප කර ඇති ප්‍රචාරක දැන්වීමක් සඳහා	40 0	75 0
4. ග්‍රැන්ට්‍රි ස්වභාවයේ පුවරුවක් සඳහා	300 0	500 0
5. වීථි නාම පුවරුවක් සඳහා එක් පුවරුවකට රු. 1,000 බැගින් ප්‍රචාරක ආයතනය මගින් ප්‍රචාරක ගාස්තු හැටියට ගෙවිය යුතු ය. (අවම වශයෙන් පුවරු 200ක්)	400 0	500 0
6. පෝස්ටර් ඇලවීම සඳහා සවි කරන පුවරු	100 0	150 0

මෙම ගාස්තුව මාස 12 ක කාලයක් සඳහා වන අතර, දැන්වීම් පුවරුව දෙපැත්තේ ම එකම දැන්වීම ප්‍රදර්ශනය කරයි නම් දෙවන පැත්ත සඳහා නියමිත ගාස්තුවෙන් 25% ක් අය කරනු ලැබේ. පැති දෙක වෙනස් වූ දැන්වීම් ප්‍රදර්ශනය සඳහා යොදා ගනී නම් සම්පූර්ණ ගාස්තුව අයකරනු ලැබේ.

ගාස්තුව අය කිරීම සඳහා දැන්වීම් පුවරුවේ ප්‍රමාණය ලෙස සවි කිරීමට යොදා ගන්නා ආධාරකය හැර පුවරුවේ මුහුණත දිග සහ පළල සැළකිල්ලට ගනු ලැබේ.

ඉහත ගාස්තු බලප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන සියලුම දැන්වීම් පුවරු (නගර සභා ඉඩම් හෝ ගොඩනැගිලි) සඳහා පොදුවේ ක්‍රියාත්මක වේ.

ඉහත ගාස්තුවට අතිරේකව එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවිය යුතු වේ.

ආකාශ කොඩි (බැනර්) සහ කටවුට්	ගාස්තුව (වර්ග අඩියකට) රු. ශත
මුදල් ඉපයීමේ කාර්යයන් නොවන විට	25 0
මුදල් ඉපයීමේ කාර්යයන් සඳහා වන ආකාස කොඩි (ආධාරකයක එල්ලා තබනු ලබන කටවුට් ඇතුළුව)	75 0

මෙම ගාස්තු සති දෙකක කාලයක් සඳහා වන අතර, අතිරේකව සතියකට හෝ ඉන් කොටසකට 25% ක අතිරේක ගාස්තුවෙන් අය කරනු ලැබේ.

ඉහත ගාස්තුවලට අතිරේකව එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවිය යුතු ය.

09-513/6

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2015 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014 වර්ෂයේ අගෝස්තු මස 04 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 08(09ආ) 01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ අනුව දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ, මෙම බද්දට යටත්වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු ම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහ (30) ක් සම්පූර්ණ වූ වහාම 2015 වර්ෂය සඳහා වන මෙම බද්ද දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 245 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 246 වැනි වගන්තිය සහ හතර වැනි උපලේඛනයේ විධිවිධානවලින් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ 2015 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකු මත ම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක්, 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමට දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව	II වැනි තීරුව රු. ශත
(1) (i) මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් ම සඳහා	25 0
(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා –	
(අ) එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	10 0
(ආ) එය වෙළඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම්	5 0
(iii) සෑම කරත්තයක් ම සඳහා	20 0
(iv) සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v) සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi) සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
(vii) සෑම අලියකු සඳහා	50 0

(2) රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා භාවිතා කෙරෙන අත් කරත්ත සහ වෙළඳ කටයුතු සඳහා භාවිතා නොකරන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් කෙරේ.

09-513/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.